## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

ජා-ඇල නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජා-ඇල නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 ප්‍රකාරව හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී පෙර වර්ෂවල වැරදි සඳහා සමුච්චිත අරමුදලට සිදුකළ ගැලපීම් වෙනස වූ රු.3,196,691ක් වැඩියෙන් අඩුකර තිබුණු අතර ක්ෂය ලෙස රු.13,620,777ක් ද ආයෝජන ආදායම ලෙස රු.22,762,782ක් ද ගලපා තිබුණි. | ප්‍රමිත හා එහි පරිශිෂ්ඨයෙහි පහදාදීම් හා මග පෙන්වීම්හි ප්‍රකාරව ඉදිරි වර්ෂයේ සිට ගණනය කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් ලෙස රු.56,925,735ක් ද ස්ථාවර තැන්පතුවල මුදලින් කළ ආයෝජන වටිනාකම ලෙස රු.86,142,921ක් ද ස්ථාවර තැන්පත්වලින් මුදලින් ලද පොලී වටිනාකම රු.2,914,450ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | අංක 3.30 හා එහි පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුලදී මුදලින් ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.13,816,894ක් විය යුතු වුවත් එය රු.13,828,611ක් ලෙස රු.11,717ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | එම |

| | | | |
|---|---|---|---|
| **(ඈ)** | ප්‍රමිතියටට වූ පරිශිෂ්ඨය 2හි පහදාදීම් හා මඟපෙන්වීම් හි EG 6.5 ප්‍රකාරව මුදල් සහ මුදල් හා සමාන දෑ යටතේ වසර අවසාන මුදල් සහ මුදල් හා සමාන දෑ ශේෂය ලෙස රු.42,330,279ක් දැක්විය යුතු වුවත් රු.42,300,483ක් ලෙස රු.29,796ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රමිත හා එහි පරිශිෂ්ඨයෙහි පහදාදීම් හා මග පෙන්වීම්හි ප්‍රකාරව ඉදිරි වර්ෂයේ සිට ගණනය කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය |
| (ඉ) | ප්‍රමිතියේ අංක 18.7 හා 2021 පෙබරවාරි 01 දිනැති අංක LGD/10A/4/න.ගි/2019 දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත් සභාව සතු පොත් අගය රු.346,886 ක්වූ ඉඩම් කැබලි 200ක් , යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවිකිරීම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2024 අවසාන ගිණුම සකස් කිරීමේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කරන බව. | සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ඊ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 27 දිනැති අංක LGD/09/2019(1) චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම්, ගොඩනැගිලි, වාහන හා යන්ත්‍ර, මංමාවත්, බොක්කු හා පාලම් හා ලීබඩු/උපකරණ වෙනත් සටහන් කිරීම් සඳහා වූ ආකෘති එල්.ජී.23/1, 23/2, 23/3, 23/4 හා 23/5 පිළිවෙලින් භාවිතා කර නොතිබුණි. | 2024 අවසාන ගිණුම නිවැරදිව ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව. | අදාල ආකෘති භාවිතා කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ දැක්වීම** | **අදහස් නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සභාව සතු මාර්ග 424 ක් කින් මාර්ග 405ක වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ප්‍රාග්ධනිත වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ පරිගණක මෘදුකාංග ක්ෂය වටිනාකම වූ රු.2,211,768ක් සමුච්චිත අරමුදලට රු.1,639,893ක් ලෙස ගලපා තිබුණි. | අතපසුවීමකින් ක්ෂය ගැලපීමට නොහැකි වී ඇත.එය 2024 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු.2,419,500ක් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි කෙරීගෙන යන වැඩ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.8,265,605ක පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එම | එම |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.13,084,060ක ප්‍රාග්ධන වියදම් ප්‍රදාන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ රු.13,828,611ක් ලෙස රු.744,551ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයන්හිදී මෙම දෝෂය නැවත සිදුනොවීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 දක්වා වූ විගණන ගාස්තු ගෙවා තිබුණද, ඒ සඳහා වැඩියෙන් වෙන්කර තිබු රු.2,378,139ක් ණයහිමි අධි වෙන්කිරීම් ලෙස කපා හැර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | එම |
| (උ) | 2023 දෙසැම්බර් 31 දින අවසන්වී තිබුණු ව්‍යාපෘති 4ක එකතුව රු.3,218,117ක් මාර්ග පාලම්, බෝක්කු වටිනාකම ලෙස ගිණුම් ගත කරනු වෙනුවට එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු වටිනාකමේ එකතුව වූ රු.3,595,000ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | සිදුවී ඇති ගිණුම්කරණ දෝෂ නිවැරදි කරන බව. | එම |
| (ඌ) | වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 05ක වැඩවල එකතුව වූ රු.8,700,000ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023.12.31 වනතෙක් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී නොතිබූ බැවින් ණයහිමි සඳහා ඇතුලත් නොකරන ලද බව. | එම |
| (එ) | මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 3කට අදාල එකතුව රු.1,835,294ක් ප්‍රාග්ධනිත කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැරදීමකින් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව. | එම |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් ගිණුම් ශේෂ 4 ක් හා ඒවාට අදාල උපලේඛනවල එකතුන් අතර රු.13,501,502 ක් වූ නොසැසඳීමක් විය. | එය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛන හා සභාව තුල වූ ලේඛන සහ පරිගණක මෘදුකාංගයෙන් ලබාගත් වාර්තා අනුව ගිණුම් 05ක ශේෂයන් අතර රු.3,919,204ක හා ලැබිය යුතු කඩ කුලී වට්නාකම්වල රු.3,043,520ක නොසැසඳුණු වෙනස්කම් පැවතුණි. | ලැබිය යුතු කඩ කුලී හා තොග වෙනස මේවනවිට නිවැරදි කර ඇති බව. | වෙනස්කම් සිදුනොවීමට පාලනයන් යෙදිය යුතුය. |

## 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | 23,988,022 | විස්තරාත්මක උපලේඛන | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ගිණුම් වලට ගැලපීම සඳහා කටයුතු කරන බව. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බව. | යොමුගත පනතට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභා මුල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 13 හා 14 හා මුදල් රෙගුලාසි 104 හා 105 | 2021 දෙසැම්බර් මස සිට 2023 ජූලි 05 දින දක්වා කොම්පෝස්ට් පොහොර අලෙවියෙන් ලැබූ රු. 348,600ක මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් කටයුතු සිදුකර නොතිබුණි. | සිදුව තිබූ ඌනතාවය මුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | යොමුගත රීති හා රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | | |
|---|---|---|---|---|
| I | මු.රෙ.571 | එකතු වටිනාකම රු.3,162,080 ක් වූ වර්ෂ 2 ඉක්මවූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | රු.3,162,080ක ශේෂය රඳවා තබා ගතයුතු බවට අදාළ අංශ හා විෂයය නිලධාරින් සඳහන් කර ඇති බව. | යොමුගත රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| II | මු.රෙ.571(5) | 2012 හා 2015 වර්ෂවල අවස්ථා 2කදී ලබාදී තිබූ රු.158,749 ක් වූ අත්තිකාරම් 2023 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | රු.383,340.84 ක් මුදලින් හිලව් කිරීමට අනුමැතිය ලැබී ඇති බව හා රු.5,000.00ක් සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | එම |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3. 1 | වාහන 14ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | මේ වනවිට ඉන්ධන දහන පරීක්ෂාව සිදුකරගෙන යනු ලබන බව. | යොමුගත චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 24 දින LGD/09/2019(1) චක්‍රලේඛය | එල්.ජී. 21/2 ආකෘතියෙහි දැක්වෙන පරිදි පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි සීමා අනුමත කර ගත යුතුව තිබූ නමුත් මෙම සභාව විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස් කිරීමේදී සීමාවන් ඇතුලත් කොට ඇති බව. | එම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.142,785,008 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 25,390,606 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 48,802 | 48,635 | 36,325 | 12,310 | 46,330 | 46,185 | 38,687 | 54,320 |
| (ii) | කුලී | 19,606 | 20,494 | 13,343 | 7,151 | 22,597 | 17,666 | 21,143 | 13,655 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,203 | 1,241 | 1,241 | - | 1,200 | 443 | 482 | (39) |
| (iv) | වෙනත් ආදායම් | 117,104 | | 117,104 | | 93,409 | 18,773 | 18,868 | (96) |
| | | 188,715 | 70,370 | 168,013 | 19,461 | 163,536 | 83,067 | 79,180 | 67,840 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වෙනත් ආදායම රු.117,104,000ක් වුවත් වර්ෂය තුල ඉන් කිසිදු මුදලක් බිල් කර නොතිබුණි. | සේවාලාභියාගේ අවශ්‍යතාවය මත සපයනු ලබන සේවාවන් සඳහා බිලකිරීමක් සිදුනොවන අතර රැස්කළ ආදායමම බිල්කල ආදායම බව. | බිල් කළ යුතු ආදායම් හඳුනාගෙන බිල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 සැප්තැම්බර් 25 දිනට ඒකක 46කට අදාල හිඟ ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා වෙළඳ බලපත්‍ර එකතුව රු.79,000ක් විය. | හිඟ මුදල් සියල්ල අයකර වෙළඳ ස්ථාන 11ක් සඳහා බලපත්‍ර ලබාදී ඇති බව. | එම |
| (ඇ) | ආදායම් පරීක්ෂක විසින් ගාස්තු ගණනය කර දක්වා තිබුණු අවස්ථා 27 කට අදාල රු.108,000ක ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකර ගෙන නොතිබුණි.. | අතපසුවීමකින් වෙනත් ගොනුවක ගොනුකර තිබූ අතර මේ වන විට අදාළ ගාස්තු සියල්ල අයකර ගැනීමට කටයුතු කර ඇත. | එම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ දැක්වීම | අදහස් නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතුරු ව්‍යවස්ථා | | |
| | නගර සභා ආඥා පනතේ 153 වගන්තිය ප්‍රකාරව ආඥා පනතේ විධිවිධානවලට අනුකූල නොවන්නාවූ ද අතුරු ව්‍යවස්ථා කලින්කල සෑදීමට හැකි වුවත් සහ එම ආඥා පනතේ 157 (II) ප්‍රකාරව පොදු සහ පෞද්ගලික වෙළඳපොළවල් සහ පොළවල් නඩත්තු කිරීම, ගාස්තු අය කිරීම, වෙන්කර දීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි වුවත් සභාව සතු කඩකාමර බදු දීම විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීමට ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කළ යුතුය. |
| (ආ) | මහජන නියෝජන | | |
| | 2023 වර්ෂයේදී ලැබී තිබුණු මහජන පැමිණිලිවලින් පොදු මහජන පැමිණිලි 02ක්ද අනතුරුදායක ගස් හා අනවසර ඉදිකිරීම් පිළිබඳ මහජන පැමිණිලි 04ක් බැගින් ද 2023 සැප්තැම්බර් 19 දින වන විටත් විසඳා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | හැකි ඉක්මනින් විසඳුම් ලබා දිය යුතුය. |
| (ඇ) | පාරිසරික ගැටළු | | |
| I | සභාව විසින් කොම්පෝස්ට් අංගනය පවත්වාගෙන යනු ලබන සුදුවැල්ල පිහිටි අක්කර 11 රූඩ් 1 පර්චස් 19.20 ක් වූ සභාව සතු ඉඩමට නොදිරන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම සිදු කරන හෙයින් වර්ෂා අවස්ථාවලදී ජලය රැදී පවතින බවත්, සත්වයින් එම භූමියේ ගැවසෙන බවත් නිරීක්ෂණය වූ අතර එය මහජන සෞඛ්‍යයට හා පරිසරයට තර්ජනයක් විය. | එම | මහජන සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |
| II | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරණ ගැසට් නිවේදනය අනුව සභාව විසින් පරිසර බලපත්‍ර ලබා දිය යුතු ආයතන හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර බලපත්‍ර ලබා දිය යුතු බවට හඳුනා ගෙන තිබුණු නව ආයතන 06 න් එක් ආයතනයක් සඳහා පමණක් පරිසර බලපත්‍ර නිකුත් කර තිබුණි | එම | බලපත්‍ර ලබාගත යුතු ආයතන පිළිබඳ නිසි නියාමනයක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| III | ආයතන 6කට නිකුත් කර තිබූ පරිසර බලපත්‍ර කල් ඉකුත්වී තිබුණද එම ආයතන සඳහා නැවත නව බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | හැකි ඉක්මනින් විසඳුම් ලබා දිය යුතුය. |
| IV | 2019, 2021 හා 2023 වර්ෂවලදී පවත්වා තිබුණු පරිසර බලපත්‍ර කමිටු විසින් පරිසර බලපත්‍ර නිකුත් කළයුතු ආයතන ලෙස දක්වා තිබූ ආයතන 9ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | හැකි ඉක්මනින් විසඳුම් ලබා දිය යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදාහන හා භූමදාන කටයුතු සඳහා වූ ගාස්තු සංශෝධනය කිරීමකින් තොරව වර්ෂ 07කට වඩා පැරණි ගාස්තු අයකිරීම් කරනු ලබන බවත්, ඉල්ලුම්පත්‍රයක් නිකුත් කිරීමකින් හා සභා නිලධාරියෙකුගේ සහතික කිරීමකින් තොරව ඉල්ලීම් ලිපි මත සේවා සැපයීම් සිදු කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විධිමත් පරිදි ඉල්ලීම් ලිපි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආදාහනාගාරයයේ ගෑස් භාවිතය පිළිබඳව විධිමත් ලේඛනයක් ආදාහනාගාර භාරකරු විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | එම | විධිමත්ව ලේඛන නඩත්තු කළ යුතුය. |
| (ඇ) | 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පැවත එන රු.1,901,097 ක් වූ ණයහිමි ශේෂ 26ක් නිරවුල් කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | එම | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව ශාන්ත මරියා පාර සුළු ව්‍යාපාර කඩකාමර 22ක් බදු දී පැවති අතර ඒවායින් කඩකාමර 16කට අදාල ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එසේම අතුරු බදු ලබාදී තිබූ කඩ කාමර 03ක් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | නිසි පරිදි ගිවිසුම් ගත විය යුතුය. |
| (ආ) | පොදු වෙළඳපොළ නව විවෘත කඩපිල් 16ක් සඳහා 2021 වර්ෂයේදී නව කඩ කුලී තක්සේරුවක් ලබාගෙන තිබුණද, එම නව කඩකුලී තක්සේරු මත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එමෙන්ම අතුරු බදු දී තිබුණු කඩකාමර 06 ක් සම්බන්ධයෙන් ගිවිසුමෙහි 25 කොන්දේසිය අනුව කටයුතු කර නොතිබුණි. | එම | ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොදු වෙළඳපල කඩ කාමර 105 බදු දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i | කඩ කාමරවලට අදාල ගිවිසුම්හි කොන්දේසි අංක 25 අනුව බදුකරුට කඩ කාමරයේ වෙළදාම් කිරීමට නොහැකි තත්වයක් උදා වුවහොත්, ලිත් මාසයකට කලින් සභාවට ඒ බව දන්වා ගිවිසුම අවලංගු කිරීමෙන් තම බද්ද අවසන් කළයුතු වුවත් බදුකරුවන් විසින් කඩකාමර 39ක් අතුරු බදු ලබාදී තිබීම සම්බන්දයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | ගිවිසුම ප්‍රකාරව කඩ කාමර නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii | සභාව වෙත පවරාගෙන තිබුණු කඩ කාමර 07ක් නැවත බදු දීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම | කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |
| iii | කඩකාමර 96කට අදාල ගිවිසුම් නැවත අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම | ගිවිසුම් අළුත් කළ යුතුය. |
| iv | මාස 01 සිට මාස 29 දක්වා හිඟව පැවති කඩකුලී රු. 5,379,493ක් අයකර ගැනීමට හෝ බදු ගිවිසුම්හි කොන්දේසි අංක 03 හා 33 අනුව අනුව ක්‍රියා කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | එම | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | නව වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 54 ක් බදු දීම සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i | වලංගු කාල පරිච්ඡේදයක් නිශ්චිතව සඳහන් කර නොතිබුණු ගිවිසගනු ලැබූ ආරම්භක දිනය සඳහන්ව පැවති කඩ කාමර 35ක් සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහන් කරමින් නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| ii | විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගිවිසුම් කාල පරිච්ඡේදය අවසන්වී තිබූ කඩ කාමර 11ක බදු ගිවිසුම් අළුත් කර නොතිබුණි. | එම | -එම- |
| iii | කඩ කාමර 12 කට අදාලව මාස 01 සිට මාස 83ක් දක්වා කාල පරාසයක් අතර හා කඩ කාමර 02 කට අදාලව හිඟ මාස ගණන කොපමණක් ද යන්න හඳුනාගත නොහැකිව පැවති රු. 480,003ක් වූ හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| iv | විගණනය විසින් සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී බිම් මහලෙහි කඩ කාමර 02ක් ද පළමු මහලෙහි කඩ කාමර 21ක් ද දීර්ඝ කාලයක් තිස්සේ විවෘත නොකර වසා තිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | ව්‍යාපාර සිදු නොකරන ව්‍යාපාර නැවත පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභාව සතු පොදු වෙළඳපල බිම් කොටස් 51ක් බදු ලබාදීම හා කුලී අයකර ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| i | පවරාගෙන තිබූ බිම් කොටස් 11ක් නැවත ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | නැවත බදු දීමට කටයුතු කළ යුතුය. |
| ii | බිම් කොටස් 08ක් අතුරු බදු ලබාදී තිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත | ගිවිසුම ප්‍රකාරව නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| iii | වර්ෂ 25 ක සිට වර්ෂ 30 කට වැඩි කාලයක සිට බදු ගිවිසුම්හි කල් ඉකුත්වී ඇති බිම් කොටස් 12කට හා 2021 වර්ෂයේ බදු ගිවිසුම් අවසන් වූ බිම් කොටස් 02කට අදාලව නැවත බදු ගිවිසුම් අළුත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | එම | බදු ගිවිසුම් අළුත් කළ යුතුය. |
| iv | බිම් කොටස් 23කට අදාලව මාස 01 සිට මාස 43 දක්වාවූ කාල පරිච්ඡේදයක් සඳහා හිඟ මාසික කුලී රු. 139,853ක් අය කර නොතිබුණි. | එම | හිඟ අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | පොදු වෙළඳපල විවෘත කඩ කාමර 23 නෙන්, කඩ කාමර 10ක් අතුරු බදු පදනම මත ලබාදී තිබුණු අතර ගිවිසුම්හි ගිවිසුම් කාල පරිච්ඡේදයේ අවසන් වන දිනයක් සඳහන්ව නොතිබුණු විවෘත කඩ කාමර 21ක් හා බදු ගැණුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණු විවෘත කඩ කාමරයක් සඳහා නැවත ගිවිසුම්ගත වීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. තවද, කඩ කාමර 14 ක මාස 01 ක සිට මාස 46 ක් දක්වාවූ හිඟ කඩකුලී එකතුව රු. 264,632ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම | ගිවිසුම්ගත වීමට හා හිඟ කඩ කුලී අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2018 වර්ෂයේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් එවා තිබූ තක්සේරු වටිනාකම් අදාල වලංගු කාල සීමාවන් ඉක්ම ගොස් පැවති නමුත් පොදු වෙළඳපල කඩ කාමර, නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර හා පොදු වෙළඳපල බිම් කොටස් සඳහා නව තක්සේරුවක් ලබා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කඩ කාමර සඳහා නව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | නියමිත කාලයට තක්සේරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 757(2), 760 හා 102 ප්‍රකාරව 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගත් විෂමතා ඌනතා සහ නැතිවීම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 103(1)(ඇ) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් නිශ්චය කළ යුතු වුවද ගබඩා භාණ්ඩ භෞතිකව පරීක්ෂා කර ඌනතාවයෙහි වටිනාකම වූ රු.182,144ක් නිලධාරිනියකගෙන් පියවා ගෙන තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර තොරතුරු නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හානි පාඩු ලේඛනයට අනුව 2022 වර්ෂය තුලදී අලාභහානි සිදුවී තිබූ එකතුව රු.391,882ක් වූ අවස්ථා 7ක වටිනාකම් අතරින් අවස්ථා 6ක හානි පාඩු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම හෝ ආදාල කිසිදු නිලධාරියෙකුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම හෝ සිදු කර නොතිබුණු අතර 2023 වර්ෂයට අදාලව එකතුව රු.528,944ක් වූ අවස්ථා දෙක සඳහා ද විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල නිලධාරින්ගෙන් අලාභ අයකරගෙන නොතිබුණි. | එම | විධිමත් පරීක්ෂණ පවත්වා අදාල හානි පූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 සැප්තැම්බර් 16 දින අංක LL- 6408 දරන ටිපර් රථයේ බැටරි 2ක් අස්ථානගතවීම සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කරන ලද හානි හා පාඩු ලේඛනයේ ද සඳහන් කර නොතිබුණු අතර විධිමත් පරීක්ෂණයකින් තොරව රු.138,300ක වටිනාකම ආරක්ෂක සේවා සමාගමෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. | එම | විධිමත් පරීක්ෂණයකින් පසුව අලාභ හානි අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභාව විසින් හානි හා පාඩු ලේඛනයේ සඳහන් කිසිදු හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ), මුදල් රෙගුලාසි 104(2) හා මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තා ද පිළියෙල කර නොතිබුණි. | එම | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා පිළියෙල කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ දැක්වීම | අදහස් නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ), 5.6.1(අ), 2.4.1, 2.4.1(අ), 2.3.2(ආ), 2.3.2(ඇ), 2.6.1(අ)(i), (ii), (iv), 4.2.2(අ), 4.3.1(අ) යන මාර්ගෝපදේශවලට පටහැනිව නගර සභා කාර්යාල කටයුතු පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග පද්ධති 9ක් මිලදී ගැනීම සඳහා රු.9,387,500ක් ගෙවා තිබුණු අතර විගණිත දින වන 2023 සැප්තැම්බර් 25 දින වන විටත් තොග හා ගබඩා කළමනාකරණ මෘදුකාංගය සහ වැටුප් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක තත්වයේ නොපැවති අතර ඒ සඳහා ගෙවූ රු.655,000ක් සහ රු.865,000ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි | පිළිතුරු ලබාදී නොමැත. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර සභාව වෙත අවශ්‍ය මෘදුකාංගවල අවශ්‍යතාවයන් නිසි ලෙස හඳුනාගෙන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ), 2.1.2(අ), 2.4.1, 2.4.1(අ), 2.3.2(ආ), 2.3.2(ඇ), 2.6.1(අ)(i), (ii), 4.2.2(අ), 4.3.1(අ) හා 5.6.1(අ) යන මාර්ගෝපදේශවලට පටහැනිව අන්තර්ජාලය ඔස්සේ ගෙවීමේ යෙදවුමක් මිලදී ගැනීම - තෙවන අදියර ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.3,595,000ක මුදලක් ගෙවා තිබුණු අතර සම්පූර්ණ පුහුණුව ලබා දී නොතිබියදී සියයට 25ක වටිනාකම රඳවා නොගෙන මුළු මුදලම ගෙවා තිබීමෙන් රු.898,750ක අවිධිමත් ගෙවීමක් නිරීක්ෂණය වූ අතර විගණිත දින වන 2023 සැප්තැම්බර් 25 දින වන විටත් මෘදුකාංග භාවිතයෙන් අදාල කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණු හෙයින් වැයකළ රු.3,595,000ක මුදල ම නිෂ්කාර්ය වියදමක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. 6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ අනුමත කාර්යමණ්ඩලය 141 ක්ද, එදිනට තත්‍ය කාර්යමණ්ඩලය 111 ක්ද වූ අතර ඒ අනුව පුරප්පාඩු 30 ක් පැවතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සභාවේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යා හැකි අයුරින් කාර්ය මණ්ඩලය මෙහෙය වීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(I) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |